රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 288

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1985 මැයි මස 2 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**1980 ජූලි මස තනතුර අතහැර යාමෙන් පසු නැවත සේවයේ පිහිටුවූ හෝ විශ්‍රාම ගිය රජයේ නිලධාරීන්ට ගෙවන වැටුප් හා විශ්‍රාම වැටුප්.**

1980 ජූලි මස තනතුර අතහැර යාමෙන් පසු නැවත සේවයේ පිහිටුවනු ලැබූ සථිර රජයේ නිලධාරීන්ට:-

(අ) නැවත සේවයේ පිහිටුවා, 1981.12.29 දිනැති අංක:197 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ හා ඉන්පසු තීරණවල නව ඒකාබද්ධ වැටුප් පරිමාණය නොසළකා, 1980 පැවති වැටුප් පරිමාණයන් මත, වැටුප් ගෙවනු ලබන අතර

(ආ) ඔවුන් විශ්‍රාම යන විටදී, එමෙන්ම අංක:197 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි හා ඉන්පසු තීරණවල නව ඒකාබද්ධ වැටුප් පරිමාණයක් නොසළකා, 1980 පැවති වැටුප් පරිමාණයන් මත ඔවුන්ගේ විශ්‍රාම වැටුප ගෙවනු ලැබේ.

02. 1982.1.1 දිනට පසුව නැවත සේවයේ පිහිටුවා ඇති රජයේ නිලධාරීන්ට වැටුප් හෝ විශ්‍රාම ගෙන ඇති පුද්ගලයන්ට විශ්‍රාම වැටුප් හෝ ගණන් බැලීමේදී, නව වැටුප් ක්‍රම සම්බන්ධයෙන් 29.12.1981 දිනැති අංක: 197 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා ඉන්පසු දැනුම් දුන් අනෙකුත් තීරණ අනුගමනය කරනු මැනවි.

Siriwardhana
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

ර/29.